# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2062/29 - 2018 මාර්තු මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2018.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ඇ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සබරගමුව පළාතේ, පළාත් පාලන කොමසාරිස් බි. ඒ. සී. පි. බමුණුආරච්චි වන මම 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ඇ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත තුළ පිහිටියා වූ මෙහි පහත උපලේඛනය යටතේ නම් සඳහන් පළාත් පාලන ආයතන සඳහා නගරාධිපති/සභාපති, නියෝජ්‍ය නගරාධිපති/උප සභාපති තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා වන පළමු රැස්වීම පහත උපලේඛනය යටතේම අනුරූපීව දක්වා ඇති දිනයෙහි නියමිත වේලාවට එහි සඳහන් කර ඇති ස්ථානයේදී කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

බී. ඒ. සී. පී. බමුණුආරච්චි,
පළාත් පාලන කොමසාරිස්,
සබරගමුව පළාත.

2018 මාර්තු මස 15 වෙනි දින,
රත්නපුර, නව නගරයේ පිහිටි,
සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *පළාත් පාලන ආයතනයේ නම* | *තෝරා පත් කරනු ලබන ධූරය* | *කැඳවනු ලබන දිනය* | *කැඳවනු ලබන වේලාව* | *කැඳවනු ලබන ස්ථානය* |
|---|---|---|---|---|
| බළන්ගොඩ ප්‍රාදේශීය සභාව | සභාපති/උප සභාපති | 2018.03.23 | පෙ. ව. 9.30 | සමනල වැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය |
| බළන්ගොඩ නගර සභාව | සභාපති/උප සභාපති | 2018.03.23 | ප. ව. 2.30 | බළන්ගොඩ නගර සභාවේ රැස්වීම් ශාලාව |
| අරණායක ප්‍රාදේශීය සභාව | සභාපති/උප සභාපති | 2018.03.26 | පෙ. ව. 9.30 | අරණායක ප්‍රාදේශීය සභාවේ රැස්වීම් ශාලාව |
| මාවනැල්ල ප්‍රාදේශීය සභාව | සභාපති/උප සභාපති | 2018.03.26 | ප. ව. 2.30 | මාවනැල්ල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය |
| යටියන්තොට ප්‍රාදේශීය සභාව | සභාපති/උප සභාපති | 2018.03.27 | පෙ. ව. 9.30 | පුර නැගුම ව්‍යාපෘතිය යටතේ යටියන්තොට ඉදි කරන ලද නව ගොඩනැගිල්ල |
| බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව | සභාපති/උප සභාපති | 2018.03.27 | ප. ව. 2.30 | බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව |
| රත්නපුර මහ නගර සභාව | නගරාධිපති/ උප නගරාධිපති | 2018.03.28 | පෙ. ව. 9.30 | රත්නපුර මහා නගර සභාවේ සභා රැස්වීම් ශාලාව |


1A - PG 3941 — 09 (2018/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *පළාත් පාලන ආයතනයේ නම* | *තෝරා පත් කරනු ලබන ධූරය* | *කැඳවනු ලබන දිනය* | *කැඳවනු ලබන වේලාව* | *කැඳවනු ලබන ස්ථානය* |
|---|---|---|---|---|
| ගොඩකවෙල ප්‍රාදේශීය සභාව | සභාපති/උප සභාපති | 2018.03.28 | ප. ව. 2.30 | ගොඩකවෙල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව |
| දෙහිඕවිට ප්‍රාදේශීය සභාව | සභාපති/උප සභාපති | 2018.03.29 | පෙ. ව. 9.30 | තල්දූව - කොලොන්න රිවර් සයිඩ් හෝටලය |
| දැරණියගල ප්‍රාදේශීය සභාව | සභාපති/උප සභාපති | 2018.03.29 | ප. ව. 2.30 | දැරණියගල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව |

03 - 1295

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.